# ශ්‍රී ලංකාවේ වියපත් ජනගහණය සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි ක්‍රියාත්මකභාවය ඃ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ජේ.එම්.ටී. දිනුෂිකා*** [1]
***එම්.කේ. නදීකා දමයන්ති*** [2]

සංක්ෂේපය

2005 ජනාධිපතිවරණය ඉලක්ක කර ගනිමින් එක්සත් ජනතා නිදහස් සන්ධාන ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂයන් විසින් "මහින්ද චින්තනඃනව ශ්‍රී ලංකාවක් කරා 2006-2016" යනුවෙන් සමාජයේ විවිධ ජන කොටස් ඉලක්ක කරගනිමින් ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කරන ලදි. එම සමාජ කොටස් අතර වයස්ගත සමාජ කණ්ඩායම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තියෙහි ප්‍රතිඵලදායිබව ඇගයුමට ලක්කිරීම මෙම අධ්‍යයනයේ අධ්‍යයන ප්‍රස්තූතය විය. අධ්‍යයන ප්‍රදේශය වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අහඹු ලෙස තෝරා ගත් අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වියපත් ජනගහනය අතුරින් 50 දෙනෙකු අධ්‍යයන නියැදිය ලෙස තෝරා ගැනිණි. අධ්‍යයනය ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍ර මත පදනම් වූ අතර ප්‍රාථමික දත්ත සහ තොරතුරු ලබා ගැනීමේදී ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා උපයෝගීකර ගැනිණි. පර්යේෂණයේ ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යානමය විධික්‍රම ඔස්සේ ද ගුණාත්මක දත්ත සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය සහ විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ ද විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයන නියැදියේ ප්‍රතිචාරීන්ගෙන් 16%ක් අවු.55-65 අතර ද, 26%ක් අවු. 66-70 අතර ද පසු වූ අතර ඉතිරි පිරිස අවුරුදු 70 ඉක්මවූවෝ වූහ. නියැදියෙන් 54% වැන්දඹුවන් ද, 36%ක් විවාහකයින් ද, 8%ක් අවිවාහකයින් ද, 2%ක් දික්කසාද වූවෝ ද වූහ. 2013 වසරේ සිට විශ්‍රාමිකයින්ට රාජ්‍ය අනුග්‍රහය යටතේ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සහ පෞද්ගලික අංශයේ බැංකු ඒ සඳහා ප්‍රමුඛ දායකත්වයක් සැපයීම, විශ්‍රාම වැටුප් ඉහළ දැමීම සම්බන්ධයෙන් වැඩිහිටියන්ගෙන් බහුතරයක් තෘප්තිමත් බව අනාවරණය කළහ. නියැදියෙන් 20%ක් වැඩිහිටි කමිටුවලට සම්බන්ධව කටයුතු කරන අතර ඔවුන්ගෙන් 70%ක් අනාවරණය කරනු ලැබුවේ ඒ තුළින් තම තනිකම නැතිවී සතුටු සාමීචියේ යෙදීමට, කථාබහ කිරිමට පිරිසක් එකතුවූ බවයි. නියැදියෙන් 44%ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් නිකුත් කරන වැඩිහිටි හැඳුනුම්පත ලබාගෙන තිබූ අතර හැඳුනුම්පත ළඟ තබා ගැනීමෙන් යම් යම් ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවූ බව ඔවුන් ප්‍රකාශ කළ ද, 10% අනාවරණය කරනු ලැබුවේ තමන් වැඩිහිටි හැඳුනුම්පත හෝ එහි ප්‍රතිලාභ පිළිබඳ නොදැනුවත් බවයි. මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේ වැඩිහිටියන්ට ලබාදෙන අක්ෂිකාච ලබාගත් ප්‍රතිශතය 22%ක් වූ අතර ඔවුන්ගෙන් 10% මතය වූයේ මෙම ප්‍රතිපත්තිය යටතේ ආධාර උපකාර ලැබිය යුතු පිරිස නිසි අන්දමින් ඉලක්ක කර නොමැති බවයි. නියැදියෙන් 5%ක් ප්‍රකාශ කරනු ලැබුවේ වියපත්වූවන් සඳහා ලබාදෙන සේවා ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණියත් රැගෙන ආයුතු ලිපි ලේඛන පිළිබඳ නිසි දැනුමක් නොවීම නිසා සේවාව ලබා ගැනීමට නොහැකි වූ බවයි. අධ්‍යයනයේ නිගමනය වන්නේ වියපත් වූවන් සඳහා මෙම රාජ්‍ය ප්‍රතිපත්තිය හරහා යම් යම් සේවාවන් ලැබී ඇතත් ක්‍රියාත්මකභාවයේ ගැටලු පවතින බවයි.

ප්‍රමුඛ පද ඃ වියපත් ජනගහනය, රාජ්‍ය ප්‍රතිපත්තිය, මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, වැඩිහිටි කමිටු